අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/04/60/07/44/බඳවා ගැනීම 2018/2019(II)-01 VOL 01

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2023.09.07

.....................................................

.....................................................

.....................................................

**අංක 1885/31 හා 2014.10.22 දින දරන නව විදුහල්පති සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2018/2019 සීමිත තරඟ විභාගය සමත් අයදුම්කරුවන්ගෙන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම - II අදියර (2023)**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ බඳවා ගැනීම් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද අංක SC 93/2021(F/R), SC 40/2022(F/R), SC 26/2022(F/R), SC 476/2019(F/R) යන නඩු කටයුතු සමථයට පත් කිරීමට අදාළ 2022.12.12 දිනැති සමථ නඩු තීන්දුව ප්‍රකාරව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථානුකූලව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබ කැඳවනු ලබන බව සතුටින් දන්වා සිටිමි.

02. ඒ අනුව උක්ත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත දැක්වෙන නියමිත දිනය හා වේලාව අනුව, බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ 7 වන මහලේ ශ්‍රවණාගාරයට පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

දිනය : 2023.09.20
වේලාව : 12.00-01.00 pm
සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අංකය : 1
සම්මුඛ පරීක්ෂණ කැඳවීම් අංකය : 3788

03. එදිනට පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් හා සේවා පළපුරුද්දට අදාළ ලිපි ලේඛන වල මුල් පිටපත් හා එම ලේඛනයන්හි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද ඡායා පිටපත් වෙන වෙනම ලිපි ගොනු දෙකක රැගෙන එන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි. සම්මුඛ පරීක්ෂණයට රැගෙන එන ඡායා පිටපත් ගොනුව දුඹුරු වර්ණයෙන් යුක්ත විය යුතුය.
(අංක I සිට VI දක්වා වන ලේඛන **පමණක්** සියලුම දෙනා විසින් අනිවාර්යෙන්ම රැගෙන ආ යුතු අතර, අංක VII සිට XI දක්වා ඇති 2018.06.01 දිනට සපුරා ඇති අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වලින් ඔබට අදාළ වන සුදුසුකම් වල සහතික පමණක් ඉදිරිපත් කල යුතුය.)

I. ජාතික හැඳුනුම්පත
II. උප්පැන්න සහතිකයේ අනු පිටපතක් (නමෙහි වෙනස්කම් ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක්)
III. සේවා සහතිකය (වර්තමාන සේවා ස්ථානයෙන් ලබා ගත යුතුය)
IV. ශ්‍රී ලංකා ගුරු සේවයේ මුල් පත්වීම් ලිපිය
V. ගුරු සේවයේ ස්ථිර කරන ලද ලිපිය
VI. විධිමත්ව සම්පූර්ණ කරන ලද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ වාර්තාව මේ සමඟ ඇති ඇමුණුම 01හි ආකෘති පත්‍රය අනුව රැගෙන ආ යුතුය. (අදාළ වාර්තාවේ ඔබ සම්බන්ධයෙන් වන තොරතුරු හා ඔබගේ සුදුසුකම් වලට අදාළ තොරතුරු නිවැරදිව හා උපදෙස් ප්‍රකාරව සම්පූර්ණ කර ඇත්දැයි පරීක්ෂා කර බලා ඉදිරිපත් කල යුතුය.)
VII. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් පිරිනමනු ලැබූ අධ්‍යාපනවේදී උපාධිය පිළිබඳ සහතිකය
VIII. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් ඕනෑම විෂයය ක්ෂේත්‍රයක උපාධිය පිළිබඳ සහතිකය

IX. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව පිළිබඳ සහතිකය
X. ගුරු පුහුණු සහතිකය
XI. ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව පිළිබඳ සහතිකය

04. ඉහත 03 ඡේදයෙහි දක්වා ඇති සියලුම ලේඛන සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදීම ඉදිරිපත් කල යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු ලේඛනයක් භාරගනු නොලැබේ.

05. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් සපුරාලන නිලධාරීන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ලබන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී විදුහල්පති කාර්යභාරයට අදාළ මාතෘකාවක් ඔස්සේ වාචිකව ඉදිරිපත් කිරීමක් කළ යුතුය. එම ඉදිරිපත් කිරීම සඳහා ලබා දෙන උපරිම කාලය විනාඩි 05ක් වේ. මේ සඳහා අවශ්‍ය නම් පරිශීලන ග්‍රන්ථ රැගෙන ඒමේ අවස්ථාව ඇත. අදාළ වාචික ඉදිරිපත් කිරීම සකස් කරගත් පූර්ව සැලැස්මකට අනුව ඉදිරිපත් කළ හැක. ඔබගේ ඉදිරිපත් කිරීම සඳහා පුවරු (White board සහ White board markers) පමණක් ආධාරක වශයෙන් ලබා දෙන අතර, එම ඉදිරිපත් කිරීම සඳහා ලකුණු ලබාදීමේ දී පහත සඳහන් නිර්ණායක කෙරෙහි අවධානය යොමු කරන බව වැඩිදුරටත් සඳහන් කරමි.

I. හැඳින්වීම - (ලකුණු 04)
II. ඉදිරිපත් කිරීමේ සැලැස්ම - (ලකුණු 04)
III. ඉදිරිපත් කිරීමේ කුසලතාවය - (ලකුණු 08)
IV.විෂය දැනුම - (ලකුණු 05)
V. කාල කළමනාකරණය - (ලකුණු 04)

06. සම්මුඛ පරීක්ෂණයට පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

07. මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමම පමණක් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් ලැබීම සඳහා හිමිකමක් නොවන බව ද තවදුරටත් දන්වා සිටිමි.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

සටහන:

1. ඔබට නියමිත දින නියමිත වේලාවට සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම අනිවාර්යය වේ. අධ්‍යාපන හා සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ ලේඛනයන්හි මුල් පිටපත් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද එම ලිපිවල ඡායා පිටපත් ඉහත අංක 03 හි I සිට XI දක්වා සඳහන් පරිදි අනුපිළිවෙලට ගොනු කර එම ගොනුවේ ඉදිරිපස ඔබගේ **නම, ජාතික හැඳුනුම්පත් අංකය, කැඳවීම් අංකය හා විභාග අංකය** සඳහන් කර රැගෙන එන මෙන් ඉතා ඕනෑකමින් දන්වමි.

2. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවෙන් පසුව කිසිදු හේතුවක් මත ඉහත කිසිදු ලේඛනයක් සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ නොහැකි බව අවධාරණය කරමි.

3. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන නිලධාරීන් නියමිත දිනයේදී අදාළ ලේඛනවල ඡායාපිටපත් දුඹුරු පැහැති ගොනුවක බහා රැගෙන ආ යුතුය.

ඇමුණුම 01

**<u>අංක 1885/31 හා 2014.10.22 දින දරන නව විදුහල්පති සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2018/2019 සීමිත තරඟ විභාගය සමත් අයදුම්කරුවන්ගෙන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම - II අදියර (2023)</u>**

( **<u>පහත පිටුව 3 හි ඇති උපදෙස් අනුව</u>** මෙම තොරතුරු පත්‍රිකාව සම්පූර්ණ කරන්න.)

.......................................................................... විද්‍යාලයේ සේවයේ නියුතුව සිටින ශ්‍රී ලංකා ගුරුසේවයේ.............පන්තියේ නිලධාරී.............................................................මහතා/මහත්මියගේ, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථානුකූලව සුදුසුකම් පරීක්ෂා කරනු ලබන **<u>2018.06.01</u>** දිනට පූර්වාසන්නයේ වූ වසර **<u>පහක*/හයක*</u>** කාලය තුළ තොරතුරු පහත පරිදි වේ.
(අදාළ නොවන වචන කපා හරින්න)

1. හැඳුනුම්පත් අංකය -
2. ගුරු සේවයේ පත්වීම ක්‍රියාත්මක වන දිනය -
3. ගුරු සේවයේ ස්ථිර කරන ලද දිනය -
4. පූර්වාසන්න වසර **<u>පහක*/හයක*</u>** කාලය තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර **<u>ඇත* / නැත*</u>** (අදාළ නොවන වචනය කපා හරින්න)
5. පූර්වාසන්න වසර **<u>පහක*/හයක*</u>** කාලය තුළ වැටුප් රහිත නිවාඩු ලබා **<u>ඇත* / නැත*</u>** . (අදාළ නොවන වචනය කපා හරින්න) එසේ වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම් ඒ පිළිබඳ තොරතුරු

| **වර්ෂය** | **කාලය** | **වැටුප් රහිත නිවාඩු** |
|---|---|---|
| 2012 | ........................ සිට .................... දක්වා | ......... අවු .......... මාස .......... දින |
| 2013 | ........................ සිට .................... දක්වා | ......... අවු .......... මාස .......... දින |
| 2014 | ........................ සිට .................... දක්වා | ......... අවු .......... මාස .......... දින |
| 2015 | ........................ සිට .................... දක්වා | ......... අවු .......... මාස .......... දින |
| 2016 | ........................ සිට .................... දක්වා | ......... අවු .......... මාස .......... දින |
| 2017 | ........................ සිට .................... දක්වා | ......... අවු .......... මාස .......... දින |
| 2018 | ........................ සිට .................... දක්වා | ......... අවු .......... මාස .......... දින |

6. පූර්වාසන්න වසර **<u>පහක*/හයක*</u>** කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන **<u>ඇත* / නැත*</u>** . (අදාළ නොවන වචනය කපා හරින්න) වැටුප් වර්ධක විලම්භනය කර ඇත්නම් එසේ කිරීමට හේතු :

| **වර්ෂය** | **වැටුප් වර්ධක විලම්භන කාලය** | **හේතුව** |
|---|---|---|
| 2012 | ....................... සිට .................... දක්වා | |
| 2013 | ....................... සිට .................... දක්වා | |
| 2014 | ........................ සිට .................... දක්වා | |
| 2015 | ....................... සිට .................... දක්වා | |
| 2016 | ....................... සිට .................... දක්වා | |
| 2017 | ....................... සිට .................... දක්වා | |
| 2018 | ...................... සිට ..................... දක්වා | |

.........................................
**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ**
**(අත්සන හා නිල මුද්‍රාව)**

***3 පිටුවේ උපදෙස් බලන්න**

7. පූර්වාසන්න වසර **පහක*/හයක*** කාලය තුළ විනය, දඬුවම, විගණන හෝ විමර්ශන **ඇත* / නැත*** (අදාළ නොවන වචනය කපා හරින්න) එසේ විනය දඬුවම්, විගණන හෝ විමර්ශන ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු

| **වර්ෂය** | **විනය/ විගණන/ විමර්ශන ද යන වග** | **2018.06.01 දිනට තත්ත්වය** |
|---|---|---|
| 2012 | | |
| 2013 | | |
| 2014 | | |
| 2015 | | |
| 2016 | | |
| 2017 | | |
| 2018 | | |

08. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි 03 ඡේදය අනුව, 2018.06.01 දිනෙන් පසුව අදාළ නිලධාරියා හට විනය, විගණන, විමර්ශන තිබේද යන්න පිළිබඳ තොරතුරු

| **වර්ෂය** | **විනය/ විගණන/ විමර්ශන තිබේද යන වග** | **2018.06.01 දිනෙන් පසුව තත්ත්වය** |
|---|---|---|
| 2018 | | |
| 2019 | | |
| 2020 | | |
| 2021 | | |
| 2022 | | |
| 2023 | | |

ඉහත සඳහන් කර ඇති තොරතුරු මෙම නිලධාරියාගේ / නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවට සහතික කරමි.

දිනය : .........................

..........................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

(අත්සන හා නිල මුද්‍රාව)

<u>*උපදෙස් -*</u>

1. (අ) ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව වසර 05ක පළපුරුද්ද අදාළ වනුයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවේ 7.2.2.1 හි (i) හෝ (ii) යටතේ දක්වා ඇති පහත සුදුසුකම් සහිත නිලධාරීන් වන බැවින් එම අධ්‍යාපන සුදුසුකම් සහිත නිලධාරියකු සම්බන්ධයෙන් මෙම තොරතුරු පත්‍රිකාව පිරවීමේදී සලකා බලනු ලබන පූර්වාසන්න වසර ගණන වසර 05 කි.

- 7.2.2.1 (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් අධ්‍යාපනවේදී උපාධිය

- 7.2.2.1 (ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් ඕනෑම විෂයය ක්ෂේත්‍රයක උපාධිය සමඟ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය / ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව

(ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව වසර 06ක පළපුරුද්ද අදාළ වනුයේ ව්‍යවස්ථාවේ 7.2.2.1 හි (iii) යටතේ දක්වා ඇති පහත සුදුසුකම් සහිත නිලධාරීන් වන බැවින් එම අධ්‍යාපන සුදුසුකම් සහිත නිලධාරියකු සම්බන්ධයෙන් මෙම තොරතුරු පත්‍රිකාව පිරවීමේදී අදාළ පූර්වාසන්න වසර ගණන වසර 06 කි.

- 7.2.2.1 (iii) ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව / ගුරු පුහුණු සහතිකය ලබා ඇති

(මෙම තොරතුරු පත්‍රිකාවේ සේවා පළපුරුද්දට අදාළ පූර්වාසන්න වසර ගණන නිවැරදිව සඳහන් කිරීම ඉතා වැදගත්ය)

2. නිලධාරියාට අදාළව සම්පූර්ණ කරනු ලබන තොරතුරු පත්‍රිකාවේ යම් සංශෝධනයක් සිදු කර ඇත්නම් එම <u>**ස්ථානයන්හි කෙටි අත්සන් යොදා නිලමුද්‍රාව තැබිය යුතු අතර, මකන දියර භාවිතා කර සංශෝධන සිදු නොකල යුතුය.**</u>

***සටහන* : මෙම තොරතුරු පත්‍රිකාව, මෙය රැගෙන එන නිලධාරියා / නිලධාරිනිය ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ කටයුතු සඳහා අත්‍යාවශ්‍ය වන බැවින්, සම්පූර්ණ කිරීමේදී සේවා ප්‍රමුඛතාවය ලබා දෙමින් නිවැරදිව ඉටු කර දෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි. එම ලේඛනයේ පිටපතක් සහ නිලධාරියා සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද දිනය ඇතුලත් කාලසටහනෙහි පිටපතක් නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුලත් කිරීමට කටයුතු කරන්න.මේ පිළිබඳව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.**